**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - 2019**

------------------------------------------

## 1.1 මතය

------

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ සහ 2012 අංක 15 දරන ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 46 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත්“මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 571 | 2017 වර්ෂයේ සිට පවතින එකතුව රු.114,162ක් වූ ටෙන්ඩර් ඇප තැන්පත් 09ක් සහ එකතුව රු. 610,729 ක් වූ කොන්ත්‍රාත් රුඳවුම් තැන්පත් 07ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2017 වර්ෂයේ සිට පැවති ඇප තැන්පත් වසර 02ක් ඉක්ම වූ පසු ආදායමට ගැනීමට කටයුතු කරනු ලබයි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 89,004,001ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 55,048,393ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.33,955,608 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පුද්ගල පඩිනඩි හා විශ්‍රාම ප්‍රතිලාභ වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ ජංගම අනුපාතය 1:1.25ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය 1:0.74ක් දක්වා පිරිහී තිබුණි. ඉකුත් වර්ෂය හා සසඳන කළ සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම්වල අත්තිකාරම් සහ තැන්පතු වටිනාකම රු. මිලියන 15කින් අඩුවීම සහ ජංගම වගකීම්වල ණය හිමියෝ සහ නොනිමි බාහිර පාඨමාලා ගාස්තු රු. මිලියන 13කින් වැඩි වී තිබීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විෂය නිර්දේශය අනුව පාඨමාලා විෂයයක් සඳහා දේශන පැය 45ක් ආවරණය කළයුතු වුවත් අධ්‍යයන අංශ 4 හි විෂයයන් 33 ක් පරීක්ෂා කිරීමේ දී 2017/2018 අධ්‍යයන වර්ෂයේ II සමාසිකයේ පාඨමාලා විෂයයන්ට ආවරණය නොවූ දේශන පැය ගණන සියයට 13 සිට සියයට 29 ක පරාසයක වීම හේතුවෙන් පාඨමාලාවන් හී ගුණාත්මකභාවය පිලිබඳ විගණනයේදී ගැටලුකාරී විය. | එකඟ වෙමි.<br><br>සිසුන් දේශනවලට නොපැමිණීම, නිවාඩු දිනයන් යෙදීම ආදිය දේශන නොපැවැත්වීමට හේතුව ලෙස දක්වයි. | පාඨමාලාවන් හි ගුණාත්මකභාවය පවත්වාගෙන යාමට විෂය නිර්දේශය ආවරණය විය යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ කිහිපයක සිට පැවත එන එකතුව රු. 409,800ක් වූ විවිධ ණය හිමි ශේෂ 04ක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වසර දෙක ඉක්ම වූ පසු අදායකයා විමසා රජයේ අදායමට ගැනීමට කටයුතු කරනු ලබයි. | දීර්ගකාලීනව පවතින ණය හිමි ශේෂ නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සේවයෙන් පහකරනු ලැබූ නිලධාරියකු හා සේවයෙන් ඉවත්ව ගිය කථිකාචාර්ය හිමිනමකගෙන් අයවිය යුතු එකතුව රු. 145,461 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවයෙන් ඉවත් කරන ලද නිලධාරියා විසින් ආයතනයට විරුද්ධව නඩු පවරා ඇත. අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී මෙම ණය මුදල් අයකරගැනීමට කටයුතු කරනුඇත. සේවයෙන් ඉවත්ව ගොස් ඇති කථිකාචාර්ය හිමි නමගේද සේවක අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී මෙම ණයමුදල් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | සේවක අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී ණය ශේෂ නිරවුල් කළ යුතුයි. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධතිය (ERP) ස්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමේ දී ලංසු ලියවිලි වල පොදු කොන්දේසි යටතේ, ජයග්‍රාහී ලංසුකරු මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් අවසාන වර්ෂ තුනෙහි වාර්ෂික පිරිවැටුම රු. මිලියන 50 ක් ඉක්මවා තිබිය යුතු ලෙස දක්වා තිබුණද එය නොසලකා කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ප්‍රතිග්‍රහණ ලිපියට අනුව මාස 06ක කාලයක් තුළ පද්ධතිය සාර්ථකව ක්‍රියාකාරී තත්ත්වයට පත්කළ යුතු වුවත් එය 2017 වර්ෂයේදී ආරම්භ කර තිබුණ ද 2020 ජූලි 31 දින දක්වාම පද්ධතිය සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබූ අතර ඒ වෙනුවෙන් රු. මිලියන 4 ක් වැයකර තිබුණි. එසේම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.2 වගන්තිය අනුව කොන්ත්‍රාත්කරු හා විශ්වවිද්‍යාලය අතර ගිවිසුමකට එළඹ නොතිබුණි. | එකඟ වෙමි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල අතුරින් සමස්ථ ක්‍රියාවලියම සඳහා සකස් කරනු ලබන පළමු ERP පද්ධතිය මෙය වේ. ඒ අනුව විශ්වවිද්‍යාලයක පවත්නා සංකීර්ණ ක්‍රියාවලිය අධ්‍යයනය කරමින් මෙම ව්‍යාපෘතිය සිදු කරන බැවින් යම් යම් ගැටළුකාරී තත්වයන් ඇති වූ නිසා මෙහි ගිවිසුම් අත්සන් කිරීම දිගින් දිගටම ප්‍රමාද විය. කෙසේ නමුත් ලංසුලියවිලවල කොන්දේසි ප්‍රකාරව මේ සඳහා අදාළවන මූලික ලියකියවිලි වන කාර්යසාධන බැඳුම්කරය නිසි ලෙස ලබාගෙන ඇති බැවින් නොපමාව අදාළ ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව අදාළ කාර්ය සඳහා වහාම ගිවිසුම් ගත වී කාර්යසාධන බැඳුම්කරය අපේක්ෂිත කාලය දක්වා දීර්ඝ කරගෙන ඉදිරි කටයුතු සිදු කළ යුතුයි. |
| (ආ) | විදේශීය සිසුන් සඳහා ඉදිකරනු ලබන තෙමහල් නේවාසිකාගාරයට අදාළ සැලසුම් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් අනුමැතිය ලබාගෙන නොතිබුණි. එසේම වර්ගමීටර් 1,031 ක බිම හා බිත්ති ටයිල් ඇතිරීමේ දී එකඟ වූ පිරිවිතරයන්ට අනුකූල නොවන ලෙස ටයිල් ඇතිරීම සිදු කර තිබුණ ද ඉංජිනේරු සහතිකය මත ඒ සඳහා වෙන් කළ මුදලින් සියයට 95 ක් එනම් රු. 9,567,750 ක් ගෙවීම් කර තිබුණි. | අනුමැතිය ලබා ගැනීම සඳහා අදාළ ලියකියවිලි දැනටමත් නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාර දී ඇත. Employer's requirement යටතේ නාන කාමර බිත්ති සඳහා Homogeneous Heavy Type Lanka Tile or Equalent ටයිල් වර්ගයක් ඉල්ලා තිබුණි. නමුත් ලංකා ටයිල්වල එම ටයිල් වර්ගය නිශ්පාදනය නොවන නිසා විශ්වවිද්‍යාලය විසින් | අදාළ නියාමන ආයතනවල අනුමැතිය ලබාගත යුතුය. ලංසු ලියවිලිවල සඳහන් පරිදි ප්‍රමිතියෙන් යුතු ටයිල් සවිකළ යුතුය. |

| | | |
|---|---|---|
| | wall tile එකක් වන 600mm x 300mm ප්‍රමාණයේ 521 – E වර්ගයේ Rocel Full Body Homogeneous වර්ගයේ ටයිල් අතුරා ඇත. Rocel ආයතනය මඟින් 2020 පෙබරවාරි 28 වන දිනැති ලිපිය මඟින්ද එම ටයිල් Rocel Full Body Homogeneous වර්ගය බවට තහවුරු කර ඇත. | |

**3.4 මානව සම්පත් කළමණාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ තනතුරු 8 ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 10 ක් 2019 දෙසැම්බර් 31 දින වනවිට පුරප්පාඩුව පැවතුණි. | මෙම විශ්වවිද්‍යාලයේ අනුමත තනතුරු ලේඛනය අනුව පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | පුරප්පාඩු පිරවීමට නොපමාව කටයුතු කළ යුතුය |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පැවතුණු අතර, සමාලෝචිත වර්ෂයට අදාළව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාල තම ක්‍රියාකාරී සැලැස්මෙහි ඊට අදාල ක්‍රියාකාරකම් ඇතුළත්කර තිබූ බවට හා වාර්ෂික අයවැය ලේඛනයෙහි ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසාගෙන තිබූ බවට හඳුනාගත නොහැකි විය. | මෙම විශ්වවිද්‍යාලයේ අරමුණ සලකා බැලීමේදී තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලබාගැනීම පිණිස සෘජු ලෙසම දායක නොවේ. කෙසේ නමුත් ඉදිරියේදී 2017.08.14 දිනැති අංක එන්.පී/එස්.සී.පී.17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව අනුගත වෙමින් කටයුතු කිරීමට සටහන් කරගෙන ඇත. | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුය. |